**ගම්පොල නගර සභාව**
**මහනුවර දිස්ත්‍රික්කය**

**1. මූල්‍ය ප්‍රකාශන.**

**1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම.**

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2015 මාර්තු 26 දින ද, ඉකුත් වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2014 මාර්තු 19 දින ද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2015 ජුලි 28 දින සභාවේ ලේකම්වරයාට යවා ඇත.

**1.2 මතය.**

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති වැදගත් කරුණු හේතුවෙන් මතයක් සඳහා පදනමක් සැපයීමට ප්‍රමාණවත් සහ උචිත විගණන සාක්ෂි ලබා ගැනීමට මට නොහැකි විය. ඒ හේතු කොට ගෙන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මම මතයක් ප්‍රකාශ නොකරමි.

**1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

**1.3.1 ගිණුම්කරණ අඩුපාඩු**

පහත සඳහන් ගිණුම්කරණ අඩුපාඩු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) මූල්‍ය ප්‍රකාශනවල මුදල් ශේෂය රු.7,159,980ක් අඩුවෙන් දක්වා තිබුණි.

(ආ) 2007 වර්ෂයේ ඔක්තෝබර් 30 දින ස්ථාවර නියෝග මත ගෙවූ රු.1,659,600ක මුදල ගිණුම්ගත නොකර බැංකු සැසඳුම් ප්‍රකාශයේ ගැළපීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට මුදල් ශේෂය එම ප්‍රමාණයෙන් වැඩියෙන්ද, ණයහිමියන් එම ප්‍රමාණයෙන් අඩුවෙන්ද දක්වා තිබුණි.

(ඇ) 2004 වර්ෂයේ සිට 2014 දෙසැම්බර් 31 දක්වා අවස්ථා 44කදී, අගරු වී ඇති රු.1,033,223ක් වටිනා චෙක්පත් ගිණුම්ගත නොකර බැංකු සැසඳුමේ දැක්වීම හේතුවෙන් මුදල් ශේෂය එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි.

**1.3.2 නොසැසඳූ පාලන ගිණුම්.**

ගිණුම් විෂයයන් 02කට අදාළව ගිණුම අනුව, ශේෂයන්ගේ එකතුව රු.24,425,052ක් වූ අතර, උපලේඛන අනුව එම ගිණුම් ශේෂයන්ගේ එකතුව රු.22,461,191ක් වුයෙන් රු. 1,963,861ක නොසැසඳීමක් නිරීක්ෂණය විය.

**1.3.3 ලැබියයුතු ගිණුම්**

2014 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු ගිණුම් ශේෂවල වටිනාකම රු.21,293,768ක් වූ අතර එයින් වසරක කාලයක් ඉක්මවා තිබූ ගිණුම් ශේෂවල වටිනාකම රු.2,600,995 ක් වී තිබුණි.

**1.3.4 ගෙවියයුතු ගිණුම්**

**2014 දෙසැම්බර් 31 දිනට ගෙවියයුතු ගිණුම් ශේෂ 06ක වටිනාකම රු.19,087,098ක් වූ අතර, එයින් රු.13,638,838 ක් වසරකට වැඩි ශේෂයකින් සමන්විත වී තිබුණි.**

**1.3.5 විගණනය සඳහා සාක්ෂි නොවීම.**

**2004 සිට 2007 දක්වා අවස්ථා 04කදී පොදු ගිණුමෙන් වෙනත් ගිණුම්වලට මාරුකිරීම් ලෙස හර කර තිබුණු රු.4,094,400ක මුදල සහ බැර කර තිබුණු රු.543,545ක මුදල පිළිබඳව කිසිම සාක්ෂියක් විගණනයට ඉදිරිපත් නොකෙරුණු අතර, එම මුදල් බැංකු සැසඳුම් ප්‍රකාශයට ගැළපුම් ලෙස දක්වා තිබුණි.**

**1.3.6 නීති රීති රෙගුලාසි වලට අනුකූල නොවීම.**

**පහත දැක්වෙන නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම් විගණනයේදී නිරීක්ෂණය කරනු ලැබේ.**

| නීති රීති රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| **(අ) ශ්‍රී ලංකා ජනරජයේ ආයතන සංග්‍රහය** | |
| **14.10 හා 14.11 වගන්ති** | **මියගිය/ විශ්‍රාමගිය හා ස්ථානමාරුවීම් ලබාගිය නිලධාරීන් 04 දෙනෙකුගෙන් අයවිය යුතු රු.179,280ක ආපදා ණය හා උත්සව අත්තිකාරම් අයකරගෙන නොතිබුණි.** |
| **(ආ). ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය** | |
| **i. මුදල් රෙගුලාසි 371** | **අවස්ථා 03කදී ලබාදුන් රු.38,000ක්වූ අත්තිකාරම් පියවා නොතිබුණි.** |
| **ii. මුදල් රෙගුලාසි 571** | **අවස්ථා 185කදී තැන්පත් කළ රු.2,003,375ක කල්ඉකුත් වූ තැන්පතු නියාදනය කර නොතිබුණි.** |

**2. මූල්‍ය සමාලෝචනය**

**2.1 මූල්‍ය ප්‍රතිඵල**

**ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.34,563,421 ක් වූ අතර ඊට අනුරූපිව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.19,207,539 ක් වූයෙන් මූල්‍ය ප්‍රතිඵලයේ රු.15,355,882 ක වර්ධනයක් දක්නට ලැබුණි.**

**2.2** විග්‍රාහාත්මක මූල්‍ය සමාලෝචනය

---

**සමාලෝචිත වර්ෂයේ වැටුප් ප්‍රතිපූර්ණය වශයෙන් රු.67,763,280ක් ලැබී තිබුණ නමුත්, වැටුප් හා දීමනා ලෙස රු.75,672,304ක් ගෙවා තිබුණි. ඒ අනුව සභාවේ ආදායමෙන් රු.7,909,024ක මුදලක් සභාවේ සේවකයින් සඳහා වැටුප් ගෙවීමට වැයකරන බව නිරීක්ෂණය වන අතර, එම මුදල් වැටුප් ප්‍රතිපූර්ණය හැර සභාවේ පුනරාවර්තන ආදායමින් සියයට 11ක් ගෙන තිබුණි.**

**2.3** ආදායම් පරිපාලනය

---

**2.3.1** ආදායම් රැස් කිරිමේ කාර්යය සාධනය

---

ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම්

---

**සභාපතිවරයා විසින් සමාලෝචිත වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.**

| ආදායම් විෂයය | 2014.01.01 දිනට හිඟය | වර්ෂයේ බිල් කළ ආදායම | එකතු කළ ආදායම | | 2014.01.01 දිනට හිඟ හිටි ශේෂයෙන් අය නොවූ ප්‍රමාණය | 2014 බිල් කළ ආදායමෙන් අය නොවූ ප්‍රමාණය | මුළු අයකළ යුතු ප්‍රමාණය |
|---|---|---|---|---|---|---|---|
| | | | 2014.01.01 දිනට හිඟයෙන් එකතු කළ ආදායම | 2014 වර්ෂයේ බිල් කළ ආදායමෙන් එකතු කළ ආදායම | | | |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| වරිපනම් හා බදු | **35,703,701** | **31,329,843** | **10,971,054** | **15,549,129** | **24,732,647** | **15,780,714** | **40,513,361** |
| බලපත්‍ර ගාස්තු | **-** | **2,455,326** | **-** | **2,455,326** | **-** | **-** | **-** |
| කුලී (කඩ හා නිවාස ) | **8,163,271** | **7,954,456** | **1,468,058** | **5,756,173** | **6,695,213** | **2,198,283** | **8,893,496** |
| වෙනත් (සභා ඉඩම් බදු) | **497,699** | **377,946** | **271,668** | **227,521** | **226,031** | **150,425** | **376,456** |

**2014 දෙසැම්බර් 31 දින වන විට එකතුව රු.49,783,313 ක් වූ ආදායම් හිඟ හිට තිබුණි.**

**2.3.2** වරිපනම් බදු

------------------

**i.** සමාලෝචිත වර්ෂය ආරම්භයේදී රු.**35,703,701**ක හිඟ ශේෂයක් පැවති අතර, වර්ෂයේ බිල්කිරීම් රු.**31,329,843**ක් වූ අතර , වර්ෂයේ අයකිරීම් ප්‍රතිශතය සියයට **50**ක් වූ බැවින් **2014** දෙසැම්බර් **31** දිනට රු.**40,513,361**ක හිඟ ශේෂයක් තිබුණි.

**ii.** හිඟ වරිපනම් බදු අයකරගැනීම සඳහා නගර සභා ආඥාපනතේ **170** වගන්තිය අනුව කටයුතුකර නොතිබූ අතර විගණන නියැදි පරීක්ෂණය අනුව රු.**10,000**ට වැඩි හිඟ හිටි දේපළ **797**අනාවරණය විය.

**2.3.3** බදු කුලී

----------

**i.** **2014** දෙසැම්බර් **31** දිනට රු.**8,893,496**ක අයවිය යුතු කඩ හා නිවාස කුලිය අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

**ii.** **2000** වර්ෂයේදී දි.මු.ජයරත්න මාවතේ දුම්රිය දෙපාර්තමේන්තුව සතු භූමියක ඉදිකර ඇති වෙළඳ සංකීර්ණයේ කඩ කාමර **209**කින් ගිවිසුම් ප්‍රකාරව කුලී අයනොකිරීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් **31** දිනට රු.**6,671,250**ක කුලියක් අයකරගත යුතුව පැවති අතර ඉඩම් බදු වෙනුවෙන් සභාව විසින් දුම්රිය දෙපාර්තමේන්තුවට රු.**3,627,234**ක මුදලක් ගෙවිය යුතුව තිබුණි.

**iii.** **1980** දෙසැම්බර් **31** දිනැති අංක **1980/46** දරන පළාත් පාලන කොමසාරිස්ගේ චක්‍රලේඛයේ නියමයන් පරිදි සභාව සතු කඩ කාමර සඳහා වසර **05**කට වරක් කුලී තක්සේරු කර නොතිබුණි.

**2.3.4** උසාවි දඩ හා මුද්දර ගාස්තු

--------------------------------

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් **2014** දෙසැම්බර් **31** දිනට උසාවි දඩ රු.**928,358**ක් හා මුද්දර ගාස්තු රු.**4,000,000**ක් ලැබිය යුතුව පැවතුණි.

**2.3.5** වෙනත් ආදායම්

--------------------

**(අ)** වැසිකිළි ගාස්තු

------------------

**2014** ජනවාරි **01** දිනට හිඟ හිටි පොදු වැසිකිළි ගාස්තු රු.**387,759**ක් හා සමාලෝචිත වර්ෂයේ ගාස්තුව රු.**904,407**ක් වශයෙන් එකතුව රු.**1,292,166** ක මුදලින් **2014** දෙසැම්බර් **31** දිනට කිසිදු මුදලක් අයකරගෙන නොතිබුණි.

**(ආ)** නගර ශාලාව කුලියටදීමේ ආදායම්

-------------------------------------------

සභාව විසින් ගෙන තිබූ තීරණයන්ට පටහැනි ලෙස නගර ශාලාව කුලියටදීම හේතුවෙන් වර්ෂය තුලදී රු.**154,000**ක ආදායම් අහිමිවී තිබුණි.

**2.3.6** ප්‍රචාරක දැන්වීම් පුවරු ගාස්තු

-----------------------------------

ප්‍රචාරක දැන්වීම් පුවරු පිළිබඳව විධිමත් සමීක්ෂණයක් සිදුකර නොතිබුණු අතර විගණන නියැදි පරීක්ෂණයට අනුව සභාව දැනට අයකරන පදනම මත රු.**342,050**ක ගාස්තුවක් අයකරගත යුතුව පැවතුණි.

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 මානව සම්පත් කළමනාකරණය**

පහත සඳහන් කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂය ආරම්භයේදී ප්‍රාථමික මට්ටමේ සේවක පුරප්පාඩු 20ක් පැවති අතර ඒ සඳහා අනියම් සේවකයින් 79 දෙනෙක් සේවයේ යොදවා සභා අරමුදලින් රු.11,296,710ක් වැටුප් වශයෙන් ගෙවා තිබුණි.

(ආ) පුරප්පාඩු ප්‍රමාණයට වැඩියෙන් අනියම් සේවකයින් යොදවාගෙන තිබූ නමුත් වර්ෂය තුළ රු.2,774,953 ක මුදලක් අතිකාල වෙනුවෙන් වැයකර තිබුණි.

**3.2 අනවසර ඉදිකිරීම්**

අනවසර ඉදිකිරීම් සම්බන්ධව සභාවේ පවත්වා තිබූ ලේඛනය අනුව 2014 වර්ෂයේදී අනවසර ඉදිකිරීම් 99ක් සටහන්වී තිබුණි. මෙම ඉදිකිරීම් පරීක්ෂාකර සියල්ලටම නිවේදන යවා තිබූ නමුත් අවස්ථා 07කදී හැර ඉතිරි ඉදිකිරීම් සම්බන්ධව කිසිදු නීතිමය පියවරක් ගෙන නොතිබුණි.

**3.3 මතභේදයට තුඩුදුන් ගනුදෙනු.**

සභා සේවකයෙකු නොවන අයෙකු පදිංචි සභාවට අයත් නැති දේපලක පිහිටි නිවසක් නවීකරණය කිරීමට රු.215,000ක් වැයකර තිබුණි. මීට අමතරව විදුලි වශයෙන් රු.5,280ක් හා ජල බිල්පත් වශයෙන් රු.1,554ක් සභා අරමුදලින් ගෙවා තිබුණි.

**3.4 නිෂ්ක්‍රිය /ඌන උපයෝජිත වත්කම්**

සමාලෝචිත වර්ෂය අවසානයට රු.630,220ක වටිනාකමක් වූ වත්කම් විෂයයන් 03ක් අවුරුදු 3-6 අතර කාල සීමාවක සිට නිෂ්ක්‍රියව හා ඌන උපයෝජිතව පැවති බව නිරීක්ෂණය විය.

**3.5 පාරිසරික බලපත්‍ර**

1980 අංක 47 දරණ ජාතික පාරිසරික පනතේ 23 (අ) වගන්තිය යටතේ 2008 ජනවාරි 25 දිනැති අංක 1533/16 දරන පාරිසරික ස්වභාවික සම්පත් අමාත්‍යවරයා විසින් නිකුත් කරන ලද අතිවිශේෂ ගැසට් නිවේදනය අනුව බලපත්‍ර ලබාගත යුතු වෙළඳ ව්‍යාපාර සඳහා බලපත්‍ර නිකුත්කර නොතිබුණි.

**3.6 ඝණ අපද්‍රව්‍ය කළමනාකරණය**

i. කසළ කළමනාකරණය නොකර, පස් දමා වැළලීම සිදුකරන අතර, බැකෝ යන්ත්‍රයට පමණක් කුලී වශයෙන් 2014 වර්ෂයේදී රු.831,938ක වියදමක් දරා තිබුණි.

ii ජාතික ඝණ අපද්‍රව්‍ය කළමනාකරණ මධ්‍යස්ථානයේ ආධාර යටතේ 2012 වර්ෂයේදී ගම්පොල පොදු වෙළඳපොල භූමියේ සහ රෝහල් භූමියේ රු.1,107,514ක් වැයකර ඉදිකළ ජීව වායු ඒකක 02ක සමාලෝචිත වර්ෂය අවසාන වන විට අක්‍රියවී තිබුණි.

**4. ගිණුම් කටයුතු භාවය හා යහපාලනය**

**4.1 ප්‍රසම්පාදන සැලසීම**

සමාලෝචිත වර්ෂය සඳහා සභාව ප්‍රසම්පාදන සැළැස්මක් සකස් කර නොතිබුණි.

**4.2 අයවැය පාලනය**

සමාලෝචිත වර්ෂය සඳහා පිළියෙල කර තිබුණු අයවැය ලේඛණයට අනුව ඇස්තමේන්තුගත ආදායම් හා වියදම්, තත්‍ය ආදායම් හා වියදම් සමග සැසඳීමේදී ආදායම් විෂයයන් 06ක සියයට 15 සිට සියයට 657 දක්වාද වියදම් විෂයයන් 08ක සියයට 14 සිට සියයට 85 දක්වාද විචලනයන් නිරීක්ෂණය වූ බැවින් අයවැය ලේඛණය ඵලදායී පාලන කාරකයක් වශයෙන් යොදාගෙන නොතිබූ බව නිරීක්ෂණය විය.

**4.3 විගණන හා කළමනාකරණ කමිටු**

සභාව සමාලෝචිත වර්ෂයේ විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් පවත්වා නොතිබුණි.

**4.4 අභ්‍යන්තර විගණනය**

ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි 133 සහ 2009 ජූනි 09 දිනැති අංක ඩීඑම්ඒ/2009/01 දරන කළමනාකරණ විගණන දෙපාර්තමේන්තු චක්‍රලේඛය ප්‍රකාරව ආයතනය තුළ ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සිදුකර නොතිබුණි.

**5. පද්ධති හා පාලනය**

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි සභාවේ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය
(ආ) අයවැය පාලනය.
(ඇ) ආදායම් පරිපාලනය
(ඈ) මානව සම්පත් කළමනාකරණය
(ඉ) සන අපද්‍රව්‍ය කළමනාකරණය